**චක්‍රලේඛ අංක: 04/2019**


මගේ අංකය / எனது இல. / My No. RG/MBD/ .. / චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.


## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**


වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgd.gov.lk


දිනය / திகதி / Date: 2019.02.26

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.

**<u>2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ මරණයක් ලියාපදිංචි කිරීමේ දී ප්‍රකාශ පත්‍රයක් භාරගත හැකි උපරිම කාලසීමාව නිශ්චය කිරීම.</u>**

1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 36 (6) වන වගන්තිය අනුව කල්ගත වූ මරණයක් ලියාපදිංචි කිරීමට අදාළ වන්නා වූ ප්‍රකාශ පත්‍රය අදාළ මරණය සිදු වී වසර 25 ක කාලයක් ඉකුත්වීමට පෙරාතුව කරන ලද්දක් විය යුතු බවට සඳහන් වේ.

නමුත් අතුරුදහන් වූවන් සඳහා යම් යම් සීමාවන්ට යටත්ව මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසන්නා වූ 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) පනත හා සංශෝධිත 2016 අංක 16 දරණ පනත් යටතේ අතුරුදහන් වූවෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රකාශ පත්‍රයක් සැකසිය හැකි උපරිම කාලසීමාවක් නිශ්චිතව සඳහන් කර නොමැත.

මේ සම්බන්ධයෙන් නීතිපති මතය අනුව, 2010 අංක 19 (තාවකාලික විධිවිධාන) හා 2016 අංක 16 සංශෝධිත පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අතුරුදහන්වූවකුගේ මරණයක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 36 (6) වන වගන්තියේ ප්‍රතිපාදන අදාළ නොවන බව කාරුණිකව දන්වමි.

මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් - [redacted]තිපති - E 59 / 2018 යොමුව අනුව දැන ගැනීම සඳහා

2. ලේකම් - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - ඔබගේ දැන ගැනීම සඳහා

3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා

4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් සඳහා - ඔබගේ දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

5. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා